# 07 ශ්‍රේණිය

# ඉතිහාසය

## පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර



අන්තර්ගතය හා සැකසුම -
රසික ප්‍රියදර්ශන - ව/ ඉ/ රිදී/ උදන්විට මහා විද්‍යාලය, මැල්සිරිපුර

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

# ලෝකයේ ඇතිවූ ශිෂ්ටාචාර වලින් ප්‍රධාන ශිෂ්ටාචාර

මෙම සිතියමෙහි පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර හතරක් දැක්වෙන භූගෝලීය ප්‍රදේශ පෙන්නුම් කර ඇත ප්‍රධාන ගංගා හතරක් හා ඒ අවට නිම්න ආශ්‍රිතව මෙම ශිෂ්ටාචාර ඇති වූ බව ඉන් පැහැදිලි වනු ඇත.

මානව පරිණාමීය ක්‍රියාවලියෙහි වැදගත් අවස්ථාවක් ලෙස ශිෂ්ටාචාර හඳුන්වා දිය හැක



ශිෂ්ටාචාරය යනු

දියුණු සභ්‍යත්වයක් ඇති වූ තැන ශිෂ්ටාචාරයක් බිහි වේ.

ශිෂ්ටාචාරය යන වදනෙන්

ශීලාචාර වීම,

යහපත් වීම,

යහපත් ගති පැවතුම් පවත්වාගෙන යාම,

වනචාරිබවින් මිදීම,

වැනි අර්ථය දෙයි.

## ශිෂ්ටාචාරයක ලක්ෂණ

- ගොවිතැන
- වෙළදාම
- නගර පිහිටුවීම
- ස්ථිර නිවාසවල විසීම







## මිනිසා ශිෂ්ටාචාරවත් වූ බවට සාධක

- සෞන්දර්ය රසාස්වාදය ලේඛනකලාව පාලන සංවිධානයක් ගොඩ නගා ගැනීම
- විනෝදාස්වාදය



# ශිෂ්ටාචාරය හා ඒවා පැවති කාල වකවානු සහ වර්තමානයේ ඒවා පිහිටි රටවල්

| ශිෂ්ටාචාරයේ නම | ශිෂ්ටාචාරය පිහිටි වර්තමානය දේශය | එම ශිෂ්ටාචාරය පැවති කාල වකවානුව |
|---|---|---|
| යුප්‍රටීස් ටයිග්‍රීස් | ඉරාකය | ක්‍රි පූ 3500 - 1500 |
| නයිල් නිම්න | ඊජිප්තුව (මිසරය) | ක්‍රි පූ 3100 - 1070 |
| ඉන්දු නිම්න | පාකිස්තානය | ක්‍රි පූ 2500 - 1500 |
| හොවැංහෝ නිම්න | චීනය | ක්‍රි පූ 1700 - 1000 |

## ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහි වීමට හේතු



- සරු පස
- ජලය
- ප්‍රවාහන හා ගමනාගමන පහසුකම්





# ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහි වීමට හේතු ජලය

- මනුෂ්‍යයන්ට හා අනෙකුත් සත්වයන්ට බීමට ජලය නොමැති ව එතරම් කාලයක් ජීවත් වීමට නොහැක.
- ගංගාශ්‍රිතව ජීවත් වන්නේ නම් මෙවැනි අවදානමකට මුහුණ දීමට සිදු නොවේ.
- ආහාර නිෂ්පාදනය සඳහා කෙරෙන වගාවන්ටද ජලය අවශ්‍ය වේ.
- අනෙකුත් ජල අවශ්‍යතා සපුරා ගැනීමද ගංගා අසල සිටින විට ප්‍රශ්නයක් නොවේ.





## ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහි වීමට හේතු සරුපස

- ආහාර නිෂ්පාදනය සඳහා කෙරෙන ගොවිතැනේ දී ජලය මෙන්ම සරුපස ද අත්‍යවශ්‍ය සාධකයකි.

- අවුරුද්දේ එක කාලයකදී ලැබෙන මහා වර්ෂාවෙන් ගංගා පිටාර ගලා යාමේදී වතුරත් සමග ගෙනෙන රොන් මඩ නිසා ගංගා දෙපස පස සාරවත් සිදු වීම සිදු වේ.





# ශිෂ්ටාචාර ගංගා ආශ්‍රිතව බිහි වීමට හේතු

## ප්‍රවාහන හා ගමනාගමන පහසුකම්

- ගංගා ප්‍රයෝජනවත් ප්‍රවාහන මාර්ගයක් ලෙස යොදා ගත හැකි වේ.
- යම් විට ගොඩබිම ගමනාගමනයට හා ප්‍රවාහනයට වඩා ජල මාර්ගික පරිවහනය වාසිදායකය.
- අහස්යානා නොතිබු එකල විවිධ ශිෂ්ටාචාර අතර සම්බනධතා පැවතුනේ ජලමාර්ගික පරිවහනය මගිනි.
- ගංගා මුවදොර විදේශවලින් නැව් ගොඩ බසිනා තොටුපළවල් වේ.



# පැරණි ගංගා නිම්න ශිෂ්ටාචාර

නයිල් නිම්න ශිෂ්ටාචාරය

හොවැංහෝ නදී නිම්න ශිෂ්ටාචාරය

ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

යුප්‍රටීස් - ටයිග්‍රීස් ශිෂ්ටාචාරය